All Rights Reserved
සියලුම හිමිකම් ඇවිරිණි

**සිප්යාය මූලික පිරිවෙන් අවසාන සම්මන්ත්‍රණ මාලාව - 2020**

**අන්තර් විශ්වවිද්‍යාලීය භික්‍ෂු බලමණ්ඩලය**

කාලය පැය 01 යි | **(නව නිර්දේශය)** | ඉතිහාසය 01 පත්‍රය

- මෙම කොටස ප්‍රශ්න 40කින් සමන්විත වේ.
- මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

---

❖ අංක 01 සිට 15 තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාළ පිළිතුර පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

**1. භික්ෂුණී සාසනය පිළිබඳව වැඩි දුර තොරතුරු සඳහන් වන්නේ,**

I. සීහල වංශයේ | III. දීපවංශයේ
II. මහාවංශයේ | IV. සීහලට්ඨකතා මහාවංශයේ

**2. ''මාතලේ අලුලෙන රැස් වූ පන්සියක් භික්‍ෂූන් වහන්සේ ත්‍රිපිටකය හා අර්ථකතා සංගායනා කොට පුස්කොළ පොත්වල ලියූහ. එකල අනුරාධපුරයේ රජව සිටියේ,**

I. දුටුගැමුණු රජු | III. මහසෙන් රජු
II. වලගම්බා රජු | IV. වසභ රජු

**3. හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ යාපනය පාලනය කළ ප්‍රාදේශීය පාලකයා වූයේ,**

I. ආර්ය චක්‍රවර්තී | III. සිව්වන පරාක්‍රමබාහු රජු
II. සංගිලි | IV. සපුමල් කුමරු

**4. ලක්දිව ප්‍රථම වරට ක්‍රමවත් සංවිධානාත්මක පාලන තන්ත්‍රයක් ගොඩ නගන ලද්දේ,**

I. දෙවන පැතිස් රජු | III. දුටුගැමුණු රජු
II. පණ්ඩුකාභය රජු | IV. පස්වන මිහිඳු රජු

**5. දේශ ගවේෂණයේ යෙදුන ප්‍රථම රටවල් දෙක අතුරින් එකක් වන්නේ,**

I. ඕලන්දය | III. ප්‍රංශය
II. බ්‍රිතාන්‍යය | IV. ස්පාඤ්ඤය

**6. 1640 දී ලන්දේසීන් විසින් අල්ලාගත් බලකොටුවක් වන්නේ,**

I. කළුතර අඟුරුවාතොට | III. කොළඹ කොටුව
II. ගාල්ල | IV. මන්නාරම

**7. ග්‍රීසියට දකුණු දෙසින් පිහිටි ක්‍රීට් දිවයිනේ ගොඩනැගුණු ශිෂ්ටාචාරය වන්නේ,**

I. මිසර ශිෂ්ටාචාරය | III. මිනෝවාන් ශිෂ්ටාචාරය
II. ක්‍රීට් ශිෂ්ටාචාරය | IV. බැබිලෝනියානු ශිෂ්ටාචාරය

**8. චීන දේශපාලන චින්තනය හා සමාජ චින්තනය හැඩ ගැස්වීමට පාදක වූයේ,**

I. කොන්ෆියුසියස් දහම | III. තාඕ දහම
II. බුදු දහම | IV. කිතුණු දහම

**9. අශෝක ධර්මදූත සේවයේ ප්‍රතිඵලයක් ලෙස ''ස්වර්ණ භූමියට '' ධර්ම ප්‍රචාරයට වැඩම කළ තෙරුන් වන්නේ,**

I. සෝණ සහ උත්තර තෙරවරු | III. යෝනක ධම්මරක්ඛිත තෙර
II. මහා රක්ඛිත තෙර | IV. මහා ධම්මරක්ඛිත තෙර

**10. ''ඉතිහාසය අධ්‍යයනය යනු විෂය සමූහයක් අධ්‍යයනය කිරීමයි'' මෙම ප්‍රකාශය කළේ,**

I. ඩියඩෝරස් | III. G.H. ට්‍රැවිලියන්
II. E.H. කාර් | IV. පොලිබියස්

**11. ලංකාව ප්‍රථම වරට එක්සේසත් කළ රජු වන්නේ,**

I. දුටු ගැමුණු රජු
III. වළගම්බා රජු
II. උත්තිය රජු
IV. අසේල රජු

**12. පොළොන්නරු රාජධානියේ ප්‍රථම පාලකයා,**

I. මහා පරාක්‍රමබාහු රජු
III. පළමු පරන්තක රජු
II. නිශ්ශංක මල්ල රජු
IV. පළමු විජයබාහු රජු

**13. සංඛ සෙනවියා විසින් පාලනය කරන ලද පර්වත ප්‍රදේශය වන්නේ,**

I. ගෝවින්ද මලය
III. යාපහුව පර්වතය
II. ගංදෙණිය පර්වතය
IV. දඹදෙණි පර්වතය

**14. කුරුණෑගල යුගයේ රචිත කෘතියක් වන්නේ මින් කුමක් ද?**

I. දළදා සිරිත
III. බාලාවතාරය
II. සද්ධර්මරත්නාවලිය
IV. සද්ධර්මාලංකාරය

**15. මුලු දිවයිනම බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය වූයේ,**

I. ක්‍රි.ව. 1796 - 1798 දක්වා
III. ක්‍රි.ව. 1815 - 1948 දක්වා
II. ක්‍රි.ව. 1848 - 1940 දක්වා
IV. ක්‍රි.ව. 1802 - 1815 දක්වා

❖ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැලපේ. එම *නොගැලපෙන* නාමය තොරන්න.**

16. I. සද්ධර්මරත්නාවලිය
III. බුත්සරණ
II. පූජාවලිය
IV. ජාතක කතා පොත

17. I. ගර්භය
III. බිසෝ කොටුව
II. හතරැස් කොටුව
IV. දේවතා කොටුව

18. I. සීගිරිය
III. යාපහුව
II. දඹුල්ල
IV. පිදුරුතලාගල

19. I. භද්දසාල
III. සම්බල
II. උත්තිය
IV. උපතිස්ස

20. I. මගධ
III. කෝසල
II. වජ්ජි
IV. අවන්ති

❖ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම *නොගැලපෙන* නාම ප්‍රකාශන යුගලය තොරන්න.**

21. I. තොටගමුව - විජයබා පිරිවෙන
III. දෙවිනුවර - පැරකුම්බා පිරිවෙන
II. කැරගල - පද්මාවතී පිරිවෙන
IV. වීදාගම - ශ්‍රී ඝණානන්ද පිරිවෙන

22. I. 1865 - බද්දේගම වාදය
III. 1871 - ගම්පොළ වාදය
II. 1866 - උඳන්විට වාදය
IV. 1873 - වරාගොඩ වාදය

23. I. බුරුමය - ආනන්ද විහාරය
III. ජාවා - බොරෝබුදූර් විහාරය
II. කාම්බෝජය - හේන්සා විහාරය
IV. කොරියාව - මීරුක් විහාරය

24. I. ජුපිටර් - ආලයට අධිපති දෙවියා
III. නෙප්චූන් - මුහුදට අධිපති දෙවියා
II. මාර්ස් - යුද්ධයට අධිපති දෙවියා
IV. කිබලේ (Kybele) - මව් දෙවඟන

25. I. 1833 කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය - ව්‍යවස්ථාදායකය හා විධායකය පිහිටුවීම
II. 1910 කෲ මැකලම් ආණ්ඩු ක්‍රමය - විධායක සභාව උපදේශන සභාවක් වීම
III. 1920 මැනිං ආණ්ඩු ක්‍රමය - නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාව වැඩි වීම
IV. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය - සර්වජන ඡන්ද බලය

❖ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (A),(B),(C),(D) යනුවෙන් ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තොරා,**

(**A**) සහ (**B**) පමණක් නිවැරදිනම්, **අංක** 1 ද,

(**B**) සහ (**C**) පමණක් නිවැරදිනම්, **අංක** 2 ද,

(**C**) සහ (**D**) පමණක් නිවැරදිනම්, **අංක** 3 ද,

(**A**) සහ (**D**) පමණක් නිවැරදිනම්, **අංක** 4 ද, **සළකුණු කරන්න.**

**26. අනුරාධපුර රාජධානියේ පරිහානියට බලපෑ හේතු සාධක මින් වන්නේ,**

(A) - පාලකයින් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය

(B) - කාලිංල මාඝ ආක්‍රමණය

(C) - සිංහාසනය සඳහා කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල තරගය

(D) - සිංහාසනය සඳහා මෝරිය හා ලම්බකර්ණ වංශිකයන් අතර ඇති වූ යුද්ධය

**27. 1638 උඩරට හා ලන්දේසීන් අතර ඇති වූ මූලික ගිවිසුමට අදාළ කරුණු වන්නේ,**

(A) - පෘතුග්‍රීසීන් පලවා හැරීමට උඩරට රජුට සහය නොදීමට ලන්දේසීන් එකඟ නොවීම

(B) - පෘතුග්‍රීසීන් අල්ලාගන්නා ලද බලකොටුවල රජු කැමැති නම් හමුදා නතර කිරීමට එකඟ වීම

(C) - ලන්දේසීන්ට වැයවන මුදල් ද්‍රව්‍ය මඟින් ගෙවීමට රජු එකඟ වීම

(D) - ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ ඒකාධිකාරය ලන්දේසීන්ට නොලැබීම

**28. රෝම ශිෂ්ටාචාරයේ පැවැති රාජාණ්ඩු ක්‍රමයට අදාළ ලක්ෂණයක් වනුයේ,**

(A) - රජු අසහාය නායකයා වූ අතර ප්‍රධාන විනිසුරු ධූරය ද දැරීම

(B) - මහජන සභාවක් පැවැතීම හා රජුගේ කාර්යන්ට එය සහය වීම

(C) - බලය සෙනට් සභාවට හෝ කොන්සාල් නිළධාරීන්ට පවරා තිබීම

(D) - ජනතාව විසින් පත්කරගනු ලැබූ මහේස්ත්‍රාත්වරු සිටීම

**29. 1931 දී ඇති වූ ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ ඇතුළත් යෝජනා වන්නේ,**

(A) - අග්‍රවිනිශ්චයකාරයාගේ නායකත්වයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවක් පත් කිරීම

(B) - ආණ්ඩුකාරවරයා තවදුරයත් කිරීටයේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම

(C) - සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම

(D) - ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කොට පළාත් බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම

**30.** **බුරුමය තුළ බුදු දහම ව්‍යාප්ත වීම හා සම්බන්ධ නිවැරදි කරුණු වන්නේ,**

(A) - නවවන සියවසේ යශෝවර්මන් නම් අධිරාජයාගේ සමයේ සෞගතාශ්‍රමය නමින් භික්ෂු ආරාමයක් පිහිටුවීම

(B) - අනවරථ රජු විසින් ස්වේදගොන් චෛත්‍ය ඉදිකිරීම

(C) - ක්‍යාන්සිත්ථ රජු විසින් 1090 දී ආනන්ද විහාරය ඉදිකොට බෞද්ධාගමේ දියුණුවට ක්‍රියා කිරීම

(D) - ක්‍රි.ව. 191 දී හැං-වංශික අධිරාජ්‍යයා කියා-ත්සු ප්‍රදේශයේ බෞද්ධාරාමයක් ආරම්භකිරීම

❖ **අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයේ නාම/ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ ඇති නාම/ප්‍රකාශන X තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසියම් ආකාරකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුවේ ඒවා X තීරුවේ අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| | X | | Y |
|---|---|---|---|
| 1 | සෝමාරාම විහාරය | A | පර්වත ඇමතියාගේ යෝධයා |
| 2 | දක්ෂිණ විහාරය | B | උත්තිය නමැති යෝධයා |
| 3 | සාලියාරාමය | C | සාලිය ඇමතිගේ යෝධයා |
| 4 | පර්වතාරාමය | D | වලගම්බා රජු |

I. ABDC II. CDAB III. DBCA IV. CADB

32.

| | X | | Y |
|---|---|---|---|
| 1 | කෝල්බෲක් ආණ්ඩුක්‍රමය | A | 1910 |
| 2 | කෲ මැකලම් ආණ්ඩුක්‍රමය | B | 1947 |
| 3 | මැනිං ආණ්ඩුක්‍රමය | C | 1833 |
| 4 | සොල්බරි ආණ්ඩුක්‍රමය | D | 1921 |

I. CDAB II. CABD III. CBDA IV. ABCD

33.

| | X | | Y |
|---|---|---|---|
| 1 | කුම්භකාරගාම | A | වඩු කර්මාන්තය |
| 2 | වඩ්ඩකිගාම | B | රෙදි නිෂ්පාදනය |
| 3 | මණිකාරගාම | C | කුඹල් කර්මාන්තය |
| 4 | පේසකාරගාම | D | මැණික් කර්මාන්තය |

I. BADC II. ACBD III. DACB IV. CADB

34.

| X | | Y | |
|---|---|---|---|
| 1 | ශෙනපති | A | නගරාධිපති |
| 2 | බඩගරික | B | සේනාධිපති |
| 3 | නගර ගුත්තික | C | භාණ්ඩාගාරික |
| 4 | මහලේනා | D | ප්‍රධාන ලේකම් |

I. BADC II. BDAC III. BCAD IV. BCDA

35.

| X | | Y | |
|---|---|---|---|
| 1 | දකපති | A | ජල බද්ද |
| 2 | බොජකපති | B | ඇතුන් ඇල්ලීමෙන් ලැබෙන බද්ද |
| 3 | හතිපති | C | ඉඩම් බද්ද |
| 4 | තොටබොජක | D | වරාය බදු |

I. DACB II. ABDC III. BDAC IV. ACBD

❖ අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තොරා එහි **අංකය** සලකුණු කරන්න.

| **වර්ණ අංකය** | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |

| **පළමු ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|
| 36. වැඩිම සෙල්ලිපි ප්‍රමාණයක් පිහිට වූ රජතුමා නිශ්ශංකමල්ලය. | නිශ්ශංකමල්ල රජු රජ වූයේ මහා පරාක්‍රමබාහු රජුගෙන් පසුවය. |
| 37. සිසුනාග පෙළපතේ පළමු පාලකයා අජාසත්ත රජුය. | දනනන්දන රජු මෞර්ය පෙළපතේ ශ්‍රේෂ්ඨ පාලකයෙකි. |
| 38. 1505 දී පෘතුග්‍රීසි ජාතික ලොරෙන්සෝද අල්මේදා ලක්දිවට පැමිණියේ ය. | 1602 දී ලන්දේසි ජාතික ජොරිස් වැන් ස්පිල්බර්ජන් ලක්දිවට පැමිණියේ ය. |
| 39. රාජධානි නිරිත දිගට විතැන් වීමේ පළමු රාජධානිය යාපහුව රාජධානිය යි. | 4වන බුවනෙකබාහු රජු කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයාය. |

40. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලනයට විරුද්ධව ප්‍රථම නිදහස් අරගලය ඇති වූයේ 1848 දී ය.

ගොංගාලේගොඩබංඩා දෙවන නිදහස් අරගලයේ පුරෝගාමියෙකි.